# පුංචි එමී



මෙතුකි නෙහන්සා හීන්කෙන්ද

# පුංචි එමී

මෙතුකි නෙහන්සා හීන්කෙන්ද

කතෘ

චිත්‍ර

මෙතුකි නෙහන්සා හීන්කෙන්ද

කතෘ ප්‍රකාශනයකි

කතෘගේ වෙනත් කෘති: පුංචි සුරංගනාවියයි මමයි

මහමායා බාලිකා විද්‍යාලය, මහනුවර

07-E

2026 අප්‍රේල්

ISBN: **978-624-211-129-2**

# පිදුම

මෙම කෘතිය සැකසීමට

මා දිරිගන්වා

අවශ්‍ය උපදෙස් ලබා දුන් සැමට

ආදරයෙන්

මෙම කෘතිය

පිරිනමමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය


වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10




එමී කියන්නෙ හරිම හොද ගතිගුණ තියන හොද ළමයෙක්. එයා ගහකොළට, සතුන්ට ගොඩාක් ආදරෙයි. ඒ වගේම එමීටත් හැමෝම ආදරෙයි.




මෙයාට තිබ්බා
පුංචිම පුංචි මල් වත්තක් ඒකේ
ගොඩාක් ලස්සන පාට පාට මල් තිබුණා.
එමී හැමදාම මල් එක්ක කතා කරනවා,
සිංදු කියනවා, නටනවා. මල් හැමදාම උදේට
එමී එනකල් බලාගෙන හිටියා.

“සුභ උදෑසනක් පුංචි එමී”

“සුභ උදෑසනක් මගේ
පුංචි මල් කුමරියනේ”



එමීට තවත් පුංචි
යාලුවෝ කට්ටියක්
හිටියා. ඒ තමා පැණී
කුරුල්ලෝ, මී මැස්සෝ,
සමනල්ලු, ගේ කුරුල්ලෝ,
ගිරව්. මෙයාලාත් හැමදාම උදේම
එමීගෙ මල් වත්තට එනවා. එයාලා එමීට
හරිම ආදරෙයි. හැමදාම මේ යාලුවෝ එමී එක්ක
කතා කරන්න පුරුදු
වෙලා හිටියා.



මී මැස්සෝ මල්
වත්තෙන් හොද
පිරිසිදු මල් පැණි
අරගත්තා මී වද හදන්න.
පැණි කුරුල්ලෝ පැණි බීව්වා.
ගිරව් පලතුරු කෑවා. හමෝම හරිම සතුටින්
තමයි මල් වත්තේ ඉන්නේ.
එමි යාලුවෝ
හැමෝටම හරිම
ආදරෙයි.

එමීගෙ ආදරය කරුණාව නිසා
මල් වත්තේ කවදාවත්
මල් නැති උනේ නෑ. මුලු පළාතම
හරිම සුවදයි.



ඒත් මේ හැමදේම දිහා
කෙනෙක් තරහින්
බලාගෙන හිටියා. ඒ කවුද
දන්නවාද ඒ තමයි
නපුරු මායාකාරිය. එයා
කවදාවත් හොද දේවල් බලලා
සතුටු උනේ නෑ. දවසක් රෑ මේ නපුරු
මායාකාරිය එමීගෙ මල් වත්තේ තිබුණු
ඔක්කෝම මල් කඩා ගත්තා
එයාගෙ නපුරු මායා වැඩ
වලට.

මේ වැඩේට මල්නම් පොඩ්ඩක්වත් කැමති උනේ නෑ. ඒත් මේ නපුරු මායාකාරිය මල් ගස් විනාශකරලා දැම්මා.



ඔන්න පුරුදු විදිහටම පුංචි එමී උදේම මල්වත්තට ආවා. අනේ මල්වත්තෙ එක මලක්වත් නෑ. මල් පෙති හැමතැනම වැටිලා මල් ගස් කැඩිලා මුලු වත්තම විනාශ වෙලා. මල් කුමරියෝ පුංචි එමී එක්ක තරහා වෙලා වගේ.මල් වත්ත දැකපු එමීගෙ ඇස්වලට කඳුළු ආවා එයා හයියෙන් කෑ ගහලා ඇඬුවා.



ඒ සද්දෙට සමනල්ලු, මී මැස්සෝ,
පැණි කුරුල්ලෝ, ගිරව් ආවා. එයාලා
හැමෝම ඇහුවා "ඇයි ඔයා අඬන්නේ"
කියලා.එමී මල් වත්ත පෙන්නුවා. යාලුවෝ
හැමෝම මල් වත්ත දැකලා පුදුම උනා. එයාලා
එමිගෙන් ඇහුවා "මොකද උනේ එමි" කියලා
එමි කිව්වා "මම දන්නෙ නෑ මම උදේ එනකොට
ඔක්කෝම විනාශ වෙලා තිබුනේ" කියලා.





එතකොට කැඩුණු මල් ගසක්
යට ඉදලා පුංචි දලඹු පැටියෙක්
එළියට ආවා. එයා පුංචි එමී ලගට
ඇවිත් කතා කලා.

“යාලුවේ ඊයේ රෑ නපුරු මායාකාරි ආවා.
එයා මල් ඔක්කෝම කඩාගෙන
ගස් ටිකත් විනාශ කරලා
දැම්මා. මමත් බයට හැංගිලා
හිටියේ”

දලඹු පැටියා
කිව්වා.

ඊට පස්සෙ යාලුවෝ හැමෝම
එමි එක්ක එකතු වෙලා
මල් වත්ත පුලුවන් විදිහට පිරිසිදු
කලා. “බොහෝම ස්තුතියි යාලුවනේ”
එමි පුංචි යාලුවන්ට ස්තුති කලා.
ටික කාලයකින් ආයෙත් මල් වත්ත
තිබුනාට වැඩිය ලස්සන උනා.
එදා ඉදලා මී මැස්සෝ
මල්වත්තේම හිටියා.





ඔන්න ඔහොම ඉන්න කොට
එක දවසක් රෑ අර නපුරු
මායාකාරිය මල් වත්තට ආවා.
මේක දැක්ක මී මැස්සෝ හැමෝම
එකතු වෙලා නපුරු මායාකාරිට දෂ්ඨ කලා.
මායාකාරි හොදටම බය උනා. එයා
මල් වත්තෙන්
එළියටම දිව්වා.
මායාකාරි
ගොඩාක් ඈතට
දිව්වා.

එයා අයේ කවදාවත් එමිගෙ මල් වත්තට ආවේ නෑ.


එදා ඉදලා

යාලුවෝ හැමෝම

සතුටින් හිටියා.

එමී තවත් වැඩියෙන් පරිසරයට,

සතුන්ට ආදරය කලා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)